# මිදි කප්පාදු කිරීම

ව්‍යාප්ති හා පුහුණු අධ්‍යක්ෂ

**ආර්.එම්. ආරියරත්න**

මිදි වැලක මල් හට ගැනීම සිදුවන්නේ අළුතින් ඇතිවන රිකිලිවලය. ඒ නිසා අලුත් රිකිලි ලබා ගැනීම මිදි වගා කරුවකුගේ අභිලාශය විය යුතුය. අලුත් රිකිලි ලබා ගැනීමට කප්පාදු කළ යුතු අතර ඒ සඳහා මිදි ශාකය හැඩ ගැසී ඇත. මිදි කප්පාදුව මේ අනුව වැදගත් වේ.

මිදි වැලක් කප්පාදු කල යුත්තේ වැසි රහිත මාස 3 ක පමණ වියලි කාලයක් බලාපොරොත්තුවෙනි. මේ අනුව වියලි කලාපයේ ඇති මිදි වැල් ජුනි මස වියලි බැවින් මිදි කප්පාදු කිරීම යෝග්‍ය වේ. තවද මෙම කප්පාදුවෙන් පසු නව රිකිලි ඇති වී අස්වනු මාස 3 කින් පමණ ලබාගත හැක. ඒ අනුව සැප්තැම්බර් අගදී ඇති වන වර්ෂා සමයට පෙර මිදි අස්වනු ලබාගත හැක. වියලි කලාපයේ ජුනි මස 15 ට පෙර මිදි කප්පාදු කිරීම වැදගත් වේ. එය වර්ෂා තත්වය අනුව වෙනස් කළ හැක.

මිදි කප්පාදුවට පෙර අවම වශයෙන් සතියක් පමණවත් මිදි වැල් හාමත් කිරීම සඳහා ජල සම්පාදනය සම්පූර්ණයෙන් අත්හිටුවීම කළ යුතුය. ඉන්පසු මිදිවැල් කප්පාදුකර දින 4 කින් පසු හොඳින් ජල සම්පාදනය කළ යුතුය. මිදි කප්පාදු කිරීමට පෙර හෝ පසු පහත දැක්වෙන පොහොර මිශ්‍රණය යෙදිය යුතුය. යූරියා ග්‍රෑම් 130 ටී.එස්.පී. ග්‍රෑම් 90 මියුරියේට් ඔෆ් පොටෑෂ් ග්‍රෑම් 280 ක පොහොර මිශ්‍රණයෙන් අවුරුදු එකක් වයසැති පැලයකට ග්‍රෑම් 500 ක් දැමිය යුතුය. මේ ප්‍රමාණය ක්‍රමයෙන් අවුරුදු පතා වැඩි කර අවුරුදු 3 ක් හෝ ඊට වැඩි වයසැති පැලයකට උපරිමව කි.ග්‍රෑ. 2 ක් පමණ යොදන්න. හැකිතරම් කාබනික පොහොර මේ සමග යෙදීම යෝග්‍යයි.

මිදි කප්පාදු කිරීම සඳහා අතු හොඳින් මෝරා තිබිය යුතුය. මෙවැනි අතු දුඹුරු පැහැයෙන් යුක්තය. මෙම කන්නයේ මේරූ අතු දිලිසෙන ගැඹුරු පැහැයක් ගනී. ඒවා වැඩිපුර ඇති විට වැඩි අස්වැන්නක් ගත හැක. දුඹුරු පැහැයෙන් හොඳින් වැඩුණ අතු එනම් පැන්සලක ප්‍රමාණයක හෝ ඊට වැඩි අතු සියල්ල ගැට 5 ක් හෝ 6 ක් තබා කපා ඉවත් කළ යුතුය. මෙම ගැටයේ ඇති අංකුරය විවෘත නොවූ, රිකිලි නොඇදුනු, එකක් බවට වග බලා ගත යුතුය. ඉතා කුඩා එමෙන්ම දුර්වල දුඹුරු පැහැති අතු ගැට 2 ක් හෝ 3 ක් තබා කැපිය යුතුය. සියලුම කොල පැහැති අතු සහ කොළ කප්පාදුව සමග ඉවත් වේ.

බොහෝ මිදි වර්ග ඉහත දැක්වූ කප්පාදුවට සුදුසුවන අතර මල් හට ගැනීම මෙම කප්පාදු ක්‍රමය නිසා සිදුවේ. සෑම විටම අවසාන ගැටයට සෙ.මී. 1 හෝ 2 ක් පමණ ඈතින් කෙලින් කපන්න. මෙම කන්නයේ අතු අඩු විට පෙර කන්නයේ අතු ගැට 4 ක් හෝ 5 ක් තබා කැපීමෙන් ගෙඩි ලබාගත හැක. කුමණ පුහුණු ක්‍රමයක් භාවිතා කළත්, එකම කප්පාදු ක්‍රමයක් යොදා ගත හැකි අතර, ප්‍රභේද අනුව පමණක් කප්පාදු ක්‍රමය වෙනස් වේ. ඉහත ක්‍රමය බොහෝ වර්ග සඳහා සුදුසුය. සරලය. කප්පාදුවෙන් පසු අවශ්‍ය නම් තඹ අඩංගු දිලීර නාශකයක් ඉසීම සුදුසුය. ජුනි කප්පාදුවේදී බොහෝ විට මෙය අවශ්‍ය නොවන්නේ අධික වියළි හා උෂ්ණත්වය ඇති නිසාය. කප්පාදුවෙන් පසු මැස්ස හෝ වැට අලුත්වැඩියා කර ගැනීම හා වැල් නියමාකාර හසුරුවාලීම කළ හැක.

කප්පාදු කර දින 4 කින් පසු ජලය යෙදිය යුතු අතර ඉන්පසු හොඳ තෙතමනයක් තබාගැනීම වැදගත්ය. මේ නිසා පස් අනුව දින 5 කට වරක් වත් ජලය යොදන්න. මල් පිපීම සති 3 කින් 4 කින් දැකිය හැක. මේවා ක්‍රමයෙන් ගෙඩි බවට පරිවර්තනය වී මාස 3 කදී ඉදෙනු ඇත.

## සිංහල තේරවිල්ලක්

මොණරෙක් සිටී දස අත පිල් විදගෙන
කොකෙක් සිටී කඳ මැද්දෙන් බඳගෙන
ගෙඩි කතී ලෙලි නොකතී සැමදෙන බෙදගෙන
මෙතුන් පදේ තෝරා පවසන් නැණින

දස අත පිලය කීවේ රඹ ගස නොවෙද
කඳ මැද බඳ ඉන්නේ රඹ කැන නොවෙද
ලෙල්ල ඇර කෙසෙල් ගෙඩි සැම කනවා නොවෙද
මෙතුන් පදේ තේරුවේ නැණයෙන් නොවෙද